# උත්ථාන සමයේ සයවන සතිය
# බදාදා

## පළමුවන කියැවීම

අපෝස්තුළුවරුන්ගේ ක්‍රියා පොතෙන් ගත් පාඨයෙකි.

ක්‍රියා 17:15, 22–18:1

**“ඔබ නොදැන වඳින දෙවියන් මම ඔබට පෙන්වා දෙමි.”**

පාවුලු ඇරලීමට ගිය අය ඇතන්ස් නගරය දක්වා ඔහු පිරිවරා ගියහ. හැකි පමණ ඉක්මණින් තමා වෙතට එන මෙන් සීලස්ට ද තිමෝතියස්ට ද පාවුලුගෙන් නියමයක් රැගෙන ඔව්හු ආපසු ගියහ.

එවිට පාවුලු අරියෝපග ශාලාව මැද සිට මෙසේ දෙසීය. “ඇතන්ස් වැසියෙනි, ඔබ හැම අතින්ම ආගම ධර්මයට ලැදිකම් ඇති අය බව මට පෙනේ. ඔබ නමස්කාර කරන වස්තු නරඹමින් මා යන අතර, නාඳුනන දෙවියන්ට ය යන ලේඛනයක් ඇති පූජාසනයක් ද මම දිටිමි. ඔබ නොදැන නමස්කාර කරන ඒ දෙවියන් මම ඔබට ප්‍රකාශ කරමි. ලෝකය ද එහි සියල්ල ද මවා වදාළ දෙවියන් වහන්සේ ස්වර්ගයටත් පොළොවටත් ස්වාමින්ව සිටින බැවින් උන්වහන්සේ මිනිස් අතින් සාදන ලද මාළිගාවල නොවසන සේක. උදව් උපකාරයෙන් යැපෙන අයෙකු සේ උන්වහන්සේ මිනිස් අත් වලින් උපස්ථාන නොලබන සේක. මන්ද සියල්ලන්ට ජීවිතය ද හුස්ම ද අන් සියලු දේ ද දෙන්නේ උන්වහන්සේය. උන්වහන්සේ එක් මිනිසකුගෙන් සකල මිනිස් සංහතිය මවා වදාළ සේක. මිහිපිට වාසය කරන පිණිස නියමිත කාලයන් ද වාසස්ථානවල සීමා ද නියම කළ සේක. මෙසේ කළේ දෙවියන් වහන්සේ ගැන හැඟීමකින් ද, හමුවන

බලාපොරොත්තුවෙන් යුතුව ද උන්වහන්සේ සොයන පිණිස ය. උන්වහන්සේ අප එකිනෙකාට නුදුරු ය."

"මන්ද, කියා තිබෙන පරිදි අපි උන්වහන්සේ තුළ ජීවත් වන්නෙමු. හැසිරෙමු. පවතිමු. තවද, ඔබගේ කිවිවරයන්ගෙන් සමහරෙකු පවා කියා තිබෙන පරිදි අපි උන්වහන්සේගේ දරුවෝ වෙමු"

අප දෙවියන් වහන්සේගේ දරුවන් වන බැවින් දේවත්වය වනාහි මිනිස් කලා ශිල්පයෙන් හා දක්ෂකමින් හා කැටයම් කළ රිදීයට වත් ගලට වත් සමාන යයි නොසිතිය යුතුය. ඉතින් මේ නොදැනුම්කමේ කාලයන් දෙවියන් වහන්සේ නොතකා හැරිය නමුත් දැන් සියලු මනුෂ්‍යන්ට සියලු තැන්හි මනස්ථාපනය වන්නට දැන් අණ කරන සේක. මන්ද තමන් වහන්සේ විසින් පත් කරන ලද මනුෂ්‍යයෙකු ලවා ලෝකයා ධර්මිෂ්ඨකමින් විනිශ්චය කිරීමට එක් දවසක් නියම කර තිබේ. උන්වහන්සේ ඒ මනුෂ්‍යයා මළවුන්ගෙන් උත්ථාන කිරීමෙන් සියල්ලන්ට ඒ ගැන සහතිකයක් දී තිබේ.

මළවුන්ගෙන් උත්ථාන වීම ගැන ඔවුන්ට ඇසුණ කල, සමහරු සරදම් කළහ. සමහරු "මේ ගැන ඔබ කියන දේ අපි නැවත වරක් අසන්නෙමු" යි කීහ. එවිට පාවුලු ඔවුන් කෙරෙන් අහක්ව ගියේය. එහෙත් සමහර අය ඔහුට එකතු වී අදහා ගත්හ. ඔවුන් අතුරෙහි අරියෝපගීය දියෝනිසියස් ද දමරිස් නම් ස්ත්‍රියක් ද තවත් අය ද වූහ. මින්පසු පාවුලු ඇතන්ස් නුවරින් පිටත්ව කොරින්තියට පැමිණියේ.

දේව වාක්‍යය එසේය.

# පිළිතුරු ගීය

ගීතාවලිය 148: 1–2, 11–14

පිළිතුර: සමිඳුන්ගේ මහිමය අහසත් පොළොවත් ඉක්මවා යන්නේය.

ගීය:

සමිඳුන් පසසන්න. සගලෝ සිට සමිඳුන් පසසන්න. උස් තැන්හි දී ඔබ හැම එතුමන් පසසන්න. එතුමන්ගේ සියලු දූතයෙනි එතුමන් පසසන්න. එතුමන්ගේ මුළු සේනාවෙනි, එතුමන් පසසන්න.

මිහිපිට රජවරුන් හා සියලු මිනිස් වර්ගයෙනි. අධිපතිවරුනි, ලොවේ සියලු විනිසකරුවෙනි,
තරුණ තරුණියනි, මහල්ලන් හා බාලයෙනි, අධිපතිවරුනි, ලොවේ සියලු විනිසකරුවෙනි,
තරුණ තරුණයනි, මහල්ලන් හා බාලයෙනි සමිඳුන් පසසන්න.
මොවුහු සමිඳුන්ගේ නාමය ප්‍රශංසා කරත්වා! එතුමන්ගේ නාමය පමණක් උදාරතර ය.

එතුමන්ගේ මහිමය අහසත් පොළොවත් ඉක්මවා යන්නේය.
එතුමන්ගේ සියලු සෙනඟ ද එතුමන්ට ප්‍රිය ඉශ්රායෙල් සෙනඟ ද සියලු සැදැහැවතුන් ද පැසසුමට හා මහිමයට එතුමාණෝ එසවූ සේක. සමිඳුන්ට ප්‍රශංසා කරන්න.

# සාධුකාරය

ආලේලූයා! ආලේලූයා!
"ඔබ ක්‍රිස්තුස් වහන්සේ සමග උත්ථාන කරනු ලැබූ බැවින්
දෙවියන් වහන්සේගේ දකුණු පස වැඩ හිඳින ක්‍රිස්තුස් වහන්සේ වැඩ සිටින තැන ඇති ලොව්තුරු දේ ප්‍රාර්ථනා කරන්න. "
ආලේලූයා!

# සුවිශේෂය

සුවිශේෂක ජුවාම්තුමන් විසින් ලියන ලද දේව වාක්‍යය නම් මෙසේය.

ජුවාම් 16: 12–15

**"සත්‍යතාවයේ ආත්මයාණෝ සකල සත්‍යය කරා ඔබ ගෙන යන්නාහ."**

"ඔබට කීමට තව බොහෝ දේ මට ඇත. එහෙත් දැන් ඒවා දරා ගැනීමට ඔබට නොහැකි ය. එසේ වී නමුත් ඒ තැනැත්වහන්සේ එනම් සත්‍යතාවේ ආත්මයාණන් වහන්සේ පැමිණි කල උන්වහන්සේ සම්පූර්ණ සත්‍යය කරා යෑමට ඔබට මඟ පෙන්වන සේක. මන්ද, උන්වහන්සේ සිය කැමැත්තෙන්ම කතා නොකොට උන්වහන්සේ අසන දේම පවසා, මතු සිදුවන දේ ඔබට ප්‍රකාශ කරනු ඇත. උන්වහන්සේ මා සතු දෙයින් ගෙන ඔබට ප්‍රකාශ කරන බැවින් මා මහිමයට පමුණුවන සේක. පියාණන් සතු සියල්ල මාගේ ය. ආත්මයාණන් වහන්සේ මා සතු දෙයින් ගෙන ඔබට ප්‍රකාශ කරන සේකැ යි මා කීවේ එබැවිනි"

සුවිශේෂ වාක්‍යය එසේය.